දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/08-01-20/01/2019
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2019.05. 07

ලේකම්

නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

<u>අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික විශේෂ ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම</u>

උක්ත කරුණ සම්බන්ධව ඔබ මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත යොමු කරන ලද සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂගේ අංක DCA/02/03/02/12 හා 2019.03.19 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් බඳවා ගැනීමේ පටිපාටියේ මුල් පිටපත මේ සමඟ එවන බව කාරුණිකව දන්වමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පටිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

අත්/ කළේ: ආර්.ඩී.පී.එස්.ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් -

1) ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස
2) අධ්‍යක්ෂ,සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස
3) ආයතන අධ්‍යක්ෂ ජනරාල්- කරු.දැ.ගැ.ස

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධි පන්තිය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

යොමු අංකය : DCA/02/03/02/12

දිනය : 2018.12.12

1.2 අමාත්‍යාංශය : නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

යොමු අංකය : සීඒ/6/1/3/10

දිනය : 2018.12.25

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම.

යොමු අංකය : DMS/1221 Vol I

දිනය : 2017.11.23

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය

යොමු අංකය : EST-2/RECRU/02/0155

දිනය : 2018.11.14

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය

යොමු අංකය : NSCC/5/43/86/SR-II

දිනය : 2018.11.15

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

යොමු අංකය : PSC/EST/08-01-20/01/2019

දිනය : 2019.02.26

02. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) අධි පන්තිය

3.2 ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මඟින් බඳවා ගනු ලබන, ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක / සුසාධ්‍යකාරක / උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය / පිරිස් කළමනාකරණ සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන නිලධර ගණයකි.

3.4 කාර්යයන් පැවරීම

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය: ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

05. වැටුප් :

5.1 වැටුප් කේත අංකය : MN -7 - 2016

5.2 වැටුප් පරිමාණය : - රු.41,580 - 11x755 - 18x1030 - රු.68,425/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| විශේෂ | 04 | 43,845/- |

2018.01.01 දින සිට 2020.01.01 දින දක්වා වැටුප් ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 උපලේඛන II හි සඳහන් පරිදි විය යුතුය.

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| තාක්ෂණ නිලධාරි | විශේෂ | 01 | 1.ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය භාරව කටයුතු කිරීම හා එම කාර්ය මණ්ඩලයේ අධීක්ෂණ කටයුතු<br>2.රඟහලේ ශ්‍රව්‍ය / දෘෂ්‍ය උපකරණ පරිපාලනය, නඩත්තුව හා අළුත්වැඩියාව<br>3.රාජ්‍ය උත්සව වල ශ්‍රව්‍ය / දෘෂ්‍ය උපකරණ භාවිතයට අදාල තාක්ෂණික කටයුතු ඉටු කිරීම.<br>4.ආයතන ප්‍රධානියා විසින් පවරන අනෙකුත් රාජකාරි |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 01

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| කුසලතා | 100% |

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ

7.4 කුසලතා මත බඳවා ගැනීම : සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත බඳවා ගැනීම

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

7.4.2 සුදුසුකම්

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ

7.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.4.2.3 පළපුරුද්ද : අධීක්ෂණ කළමනාකරණ තාක්ෂණික ( MN - 03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන තිබීම

7.4.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :I. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

II. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

III. I වන ශ්‍රේණියට නියමිත තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම

IV. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය 7.4.2 හි සඳහන් සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

7.4.3 වයස : අදාළ නොවේ

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාව සඳහා ලකුණු ලබා දෙන යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.

7.4.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ

7.4.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

(යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම්ද පරීක්ෂා කරනු ලැබේ.)

7.4.4.4 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සේවා පළපුරුද්ද<br>අදාළ මූලික සුදුසුකම ඉක්මවා සපුරා ඇති සක්‍රිය හා සතුටුදායක සේවා කාලය | 50 | අදාළ නොවේ |
| කුසලතාවය<br>(අවස්ථානුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පටිපාටිය අනුව කුසලතාවය තීරණය කරනු ලැබේ.) | 45 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

සටහන:

1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

2. බඳවා ගැනීම සිදුකරන අවස්ථාවේදි ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

7.4.4.4.1 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

08. කාර්යක්ෂමතා කඩඉම් විභාග : අදාළ නොවේ

09. භාෂා ප්‍රවීණතාවය : අදාළ නොවේ

10. ශ්‍රේණි උසස් කිරීම : අදාළ නොවේ

11. තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : මෙම බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් කොන්දේසි වලට අමතරව ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් විධිවිධාන සහ කොන්දේසිද අදාළ වේ .

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

"සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන ,එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව විය යුතුයි.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව විය යුතුයි

සකස් කළේ :

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : එස්. ඒ. ඩී. පත්මා එස්. සමරවීර
පරිපාලන නිලධාරී

තනතුර : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
08 වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල

දිනය : 2019/03/19

පරීක්ෂා කළේ :

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම :

තනතුර :
8 වන මහල,
"සෙත්සිරිපාය" බත්තරමුල්ල.

දිනය : 2019/3/19

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :..........................................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :

තනතුර :

නිල මුද්‍රාව :

දිනය : 2019.03.19

---

යොමු අංකය: සී/6/1/3/10..............................

2019.02.26 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධිපත්තිය සේවා ගණය සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන :

නම :

ලේකම්

නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

දිනය: 2019.4.1

නිලමුද්‍රාව:
බර්නාඩ් වසන්ත
ලේකම්
නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු
අමාත්‍යාංශය
2 වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල.

යොමු අංකය : PSC/ECT/08-01-20/01/2019

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධි පන්තිය සේවා ගණය සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2019.02.26 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..........................................................

නම : ..........................................................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2019/04/30

නිල මුද්‍රාව: එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පා
බත්තරමුල්ල.